# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 45 දරන ලොරි බලකර ලබා ගැනීමේ සහ අත්කර ගැනීමේ පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 දෙසැම්බර් මස 14 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

## ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 45 දරන
## ලොරි බලකර ලබා ගැනීමේ සහ අත්කර ගැනීමේ පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 72/70.

**මහජන කාර්යයන් සඳහා ලොරි බලකර ලබා ගැනීම හා අත්කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 45 දරන ලොරි බලකර ලබා ගැනීමේ සහ අත්කර ගැනීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මහජන කාර්යය සඳහා තාවකාලික පාවිච්චියට අවශ්‍ය ලොරි බලකර ලබා ගැනීම.**

**2.** (1) මහජන කාර්යයන් සඳහා තාවකාලික පාවිච්චියට යම් ලොරියක් ආණ්ඩුවට අවශ්‍ය බවට නියම බලධරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඒ ලොරියේ ලියාපදිංචි කළ අයිතිකරු වෙත හෝ එම ලොරිය සතු ව හෝ භාර ව සිටින තැනැත්තා වෙත භාර දෙනු ලබන (මෙහි මින් මතු "බලකර ලබා ගැනීමේ දැන්වීම" යනුවෙන් සඳහන් කරනු ලබන) දැන්වීමක් මගින් ආණ්ඩුවේ තාවකාලික පාවිච්චිය සඳහා ඒ ලොරිය ඔහු විසින් බලකර ලබා ගත හැකිය.

(2) බලකර ලබා ගැනීමේ දැන්වීම (1) වන උපවගන්තිය යටතේ භාරදීම, එම ලොරිය මහජන කාර්යයක්. සඳහා ආණ්ඩුවට අවශ්‍ය බවට තීරණාත්මක සාක්ෂිය විය යුතු අතර එය කිසි ම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

(3) බලකර ලබා ගැනීමේ දැන්වීමක් (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත භාර දී ඇති අවස්ථාවක, නියම බලධරයා විසින් බලය පවරනු ලැබූ (මෙහි මින් මතු "බලයලත් නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් නිලධරයකු විසින් නියම බලධරයා වෙනුවෙන් එම දැන්වීම අදාළ වන ලොරිය සන්තකයට ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(4) එම ලොරිය සන්තකයට ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය බව හෝ අවස්ථානුකූල බව බලයලත් නිලධරයාට පෙනී යන යම් ලිඛිත විධාන ලියාපදිංචි කළ අයිතිකරු වෙත හෝ එම ලොරිය සතු ව හෝ භාර ව සිටින තැනැත්තා වෙත ඔහු විසින් නිකුත් කළ හැකි අතර ඒ ලියාපදිංචි කළ අයිතිකරු හෝ තැනැත්තා ඒ සියලු ලිඛිත විධාන අනු ව ක්‍රියා කළ යුතුය.

(5) බලයලත් නිලධරයකු විසින් යම් පොලිස් නිලධරයකුගෙන් ඉල්ලා සිටියහොත් (4) වන උපවගන්තිය යටතේ දෙන ලද යම් විධානයක් අනුව ක්‍රියා කිරීම ගැන වග බලා ගැනීම පිණිස අවශ්‍ය විය හැකි පියවර ගැනීම සහ බලය පාවිච්චි කිරීම ඒ පොලිස් නිලධරයා විසින් කළ යුතුය.

2——ඒ 02774—10,457 (73/12)

ලොරි තාවකාලිකව පාවිච්චි කිරීමේ කාලසීමාව වර්ෂයක දී දින හැටකට වැඩි නොවිය යුතු බව.

3. මහජන කාර්යයක් සඳහා තාවකාලික පාවිච්චිය පිණිස ආණ්ඩුව විසින් මේ පනත යටතේ යම් ලොරියක් බලකර ලබා ගන්නා වූ කාල සීමාව එක් එක් ලිත් වර්ෂයේ දින හැටකට වැඩි නොවිය යුතුය.

මහජන කාර්යයක් සඳහා ලොරි අත්කර ගැනීම.

4. 2 වන වගන්තිය යටතේ බලකර ලබා ගනු ලැබූ යම් ලොරියක් යම් මහජන කාර්යයක් සඳහා ආණ්ඩුවට ස්ථිර වශයෙන් අවශ්‍ය බවට නියම බලධරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඒ ලොරිය මහජන කාර්යයක් සඳහා ආණ්ඩුවට අවශ්‍ය බව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මින් මතු මේ පනතෙහි "සතු කිරීමේ නියමයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින් ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් ඒ ලොරිය ඔහු විසින් උචිත බලධරයා වෙත පැවරිය හැකිය.

මේ පනත යටතේ බලකර ලබාගන්නා ලද ලොරි නොවන වෙනත් ලොරි අත්කර ගැනීම.

5. (1) මේ පනත යටතේ බලකර ලබා ගන්නා ලද ලොරියක් නොවන වෙන යම් ලොරියක් මහජන කාර්යයක් සඳහා ආණ්ඩුවට ස්ථිර වශයෙන් අවශ්‍ය බවට නියම බලධරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඒ ලොරිය මහජන කාර්යයක් සඳහා ආණ්ඩුවට අවශ්‍ය බව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මින් මතු මේ පනතෙහි "හිමිකර ගැනීමේ දැන්වීම" යනුවෙන් සඳහන් කරනු ලබන) දැන්වීමක් මගින් නියම බලධරයා විසින් ප්‍රකාශ කළ හැකිය. ඒ ලොරිය "නිවේදිත ලොරිය" යනුවෙන් මේ පනතෙහි මින් මතු සඳහන් කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද හිමිකර ගැනීමේ දැන්වීමක් පළ කිරීම, ඒ නිවේදිත ලොරිය මහජන කාර්යයක් සඳහා ආණ්ඩුවට අවශ්‍ය බවට තීරණාත්මක සාක්ෂියක් විය යුතු අතර එය කිසි ම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

(3) හිමිකර ගැනීමේ දැන්වීමක් (1) වන උපවගන්තිය යටතේ පළ කරනු ලැබූ අවස්ථාවක, නියම බලධරයා විසින් බලය පවරනු ලැබූ (මෙහි මින් මතු "බලයලත් නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) නිලධරයකු විසින්, කලින් කල, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මේ පනතෙහි මින් මතු "හිමිකර ගැනීම අත්හැරීමේ දැන්වීම" යනුවෙන් සඳහන් කරනු ලබන) දැන්වීමක් මගින් හිමිකර ගැනීමේ දැන්වීමෙහි සඳහන් කරනු ලැබූ ද හිමිකර ගැනීම අත්හැරීමේ දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් වූ ද ලොරිය මහජන කාර්යයක් සඳහා ආණ්ඩුවට අවශ්‍ය නොවන බව ප්‍රකාශ කළ හැකිය.

(4) කිසි ම තැනැත්තකු විසින්—

(අ) හිමිකර ගැනීමේ දැන්වීමක නිශ්චිත ව සඳහන් කරනු ලැබූ හා හිමිකර ගැනීම අත්හැරීමේ දැන්වීමකින් හිමිකර ගැනීම අත් හරිනු නොලැබූ යම් ලොරියක්; හෝ

(ආ) එකී ලොරිය සම්බන්ධයෙන් යම් අයිතිවාසිකමක් ආණ්ඩුවට හැර වෙන යම් තැනැත්තකුට බදු දීම, උකස් කිරීම, අන්සතු කිරීම, පැවරීම හෝ කවරාකාරයකින් හෝ එවැන්නකු වෙත බැහැර කිරීම නොකළ යුතු ය.

(5) නියම බලධරයා විසින්—

(අ) යම් නිවේදිත ලොරියක තත්ත්වය සම්බන්ධයෙන් වාර්තාවක් පිළියෙල කරනු ලැබීමට සැලැස්විය හැකි ය;

(ආ) වාර්තාව අදාළ වන ලොරියේ ලියාපදිංචි කළ අයිතිකරු වෙත ඒ වාර්තාවෙහි පිටපතක් ලියාපදිංචි කළ තැපෑලෙන් යවනු ලැබීමට සැලැස්විය හැකිය; තව ද

(ඇ) ඒ වාර්තාව සමඟ තමා එකඟ වන්නේ ද නැද්ද යන වග නියම බලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙන ලෙස ද එකඟ නොවන්නේ නම් තමාට තිබිය හැකි විරෝධතා සහ ඒ විරෝධතාවලට හේතු වූ කරුණු සඳහන් කරන ලෙස ද, එම විරෝධතා සනාථ කිරීම පිණිස තමා පිහිට පතන සියලු ලේඛන ඉදිරිපත් කරන ලෙස ද ඒ ලියාපදිංචි කළ අයිතිකරුට නියම කළ හැකිය.

(6) (අ) හිමිකර ගැනීම අත් හැරීමේ දැන්වීමකින් හිමිකර ගැනීම අත්හරිනු නොලැබූ යම් නිවේදිත ලොරියක් නියම බලධරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන සතු කිරීමේ නියමයකින් ඒ නියමයෙහි නිශ්චිත ව සඳහන් දිනයක සිට ආණ්ඩුව සඳහා සතු වෙනු වෙන් උචිත බලධරයා වෙත පැවරිය හැකිය.

(ආ) සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීමට පෙර ඒ සතු කිරීමේ නියමය ක්‍රියාත්මක වන දිනය, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මඟින්, නියම බලධරයා විසින් කලින් කල වෙනස් කළ හැකිය.

(ඇ) සතු කිරීමේ නියමයකට ඒ නියමයෙහි නිශ්චිත ව සඳහන් යම් ලොරියක් පිළිබඳ පරම අයිතිය සියලු බැඳීම්වලින් තොර ව ආණ්ඩුවට ලබා දීමේ බලපෑම ඇත්තේ ය.

6. (1) යම් ලොරියක් මේ පනතේ පෙරාතුව වූ විධිවිධාන යටතේ ආණ්ඩුව සඳහා බලකර ලබා ගන්නා ලද හෝ සතු කර ගන්නා ලද හා එම ලොරියේ නඩත්තුව සම්බන්ධයෙන් යම් අමතර කොටසක් අවශ්‍ය බවට නියම බලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, 5 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් ආකාරයට ම පළ කරනු ලබන (මෙහි මින් මතු "හිමිකර ගැනීමේ දැන්වීම" යනු වෙන් සඳහන් කරනු ලබන) දැන්වීමක් මගින් මහජන කාර්යයක් සඳහා එම අමතර කොටස ආණ්ඩුවට අවශ්‍ය බව නියම බලධරයා විසින් ප්‍රකාශ කළ හැකිය.

ආණ්ඩුව සඳහා බලකර ලබා ගන්නා ලද හෝ සතුකර ගන්නා ලද යම් ලොරියක අමතර කොටස් අත්කර ගැනීම.

(2) එම හිමිකර ගැනීමේ දැන්වීම සහ එම හිමිකර ගැනීමේ දැන්වීමෙහි සඳහන් අමතර කොටස අත්කර ගැනීම සම්බන්ධයෙන් 5 වන වගන්තියේ (2) සිට (6) දක්වා වූ (දෙක ම ඇතුළු ව) උපවගන්තිවල විධිවිධාන අදාළ වන අතර, ඒ උපවගන්ති අදාළ කිරීමේ දී එහි සඳහන් "ලොරි" යන වචනය අමතර කොටස් සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස ද "ලියාපදිංචි කළ අයිතිකරු" යන වචනය එවැනි අමතර කොටස් අයිතිකරු සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස ද තේරුම් ගත යුතුය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක සඳහන් යම් අමතර කොටසක් සන්තකයට ගැනීම සම්බන්ධයෙන් 7 වන සහ 8 වන වගන්තිවල විධිවිධාන අදාළ වන අතර, ඒ වගන්ති අදාළ කිරීමේ දී "ලොරි" සහ "ලියාපදිංචි කළ අයිතිකරු" යන වචන වලින් පිළිවෙලින් අමතර කොටස සහ අමතර කොටසේ අයිතිකරු. අදහස් වන ලෙස කියවා තේරුම් ගත යුතුය.

(4) මේ වගන්තිය යටතේ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ යම් අමතර කොටසක් වෙනුවෙන් වන්දි ඉල්ලීම සහ ගෙවිය යුතු වන්දිය නිර්ණය කිරීම සම්බන්ධයෙන් 9 වන වගන්තියේ සිට 13 වන වගන්තිය දක්වා වූ (දෙක ම ඇතුළු ව) වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව අදාළ වන්නේ ය.

**ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ ලොරිවල සන්තකය භාරගැනීම ආදිය.**

7. (1) උචිත බලධරයා වෙත සතු කරනු ලැබූ යම් ලොරියක සන්තකය බලයලත් යම් නිලධරයකු විසින් ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් භාරගත හැකිය.

(2) යම් ලොරියක් සම්බන්ධයෙන් සතු කිරීමේ නියමයක් කරනු ලැබූ අවස්ථාවක, බලයලත් නිලධරයකු විසින්, ඒ ලොරියේ ලියාපදිංචි කළ අයිතිකරුට හෝ ඒ ලොරිය සතු ව හෝ භාර ව සිටින තැනැත්තාට ඒ ලොරියේ සන්තකය භාර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය බව හෝ අවස්ථානුකූල බව ඒ නිලධරයාට පෙනී යන යම් ලිඛිත විධාන කිරීම නීත්‍යනුකූල වන අතර, ඒ ලොරියේ ලියාපදිංචි කළ අයිතිකරු හෝ එය සතු ව හෝ භාර ව සිටින තැනැත්තා ඒ සියලු ලිඛිත විධාන අනු ව ක්‍රියා කළ යුතුය.

(3) බලයලත් නිලධරයකු විසින් යම් පොලිස් නිලධරයකුගෙන් ඉල්ලා සිටිය හොත් (2) වන උපවගන්තිය යටතේ දෙන ලද යම් විධානයක් අනු ව ක්‍රියා කිරීම ගැන වගබලා ගැනීම පිණිස අවශ්‍ය විය හැකි පියවර ගැනීම සහ බලය පාවිච්චි කිරීම ඒ පොලිස් නිලධරයා විසින් කළ යුතුය.

**ලොරිවල සන්තකය භාර ගැනීම වැළැක්වීම හෝ ඊට බාධාකිරීම.**

8. (1) (අ) යම් ලොරියක සන්තකය 2 (3) වන වගන්තිය හෝ 7 (1) වන වගන්තිය යටතේ ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් භාර ගැනීමෙන් හෝ භාර ගැනීමෙහි ලා යම් තැනැත්තකු වළක්වන, ඔහුට බාධා කරන හෝ විරුද්ධකම් පාන හෝ යම් කෙනකු ලවා කෙළින් ම හෝ අන් ලෙසකින් වළක්වන, ඔහුට බාධා කරවන හෝ විරුද්ධකම් පෑමට සලස්වන ; හෝ

(ආ) 2 (3) වන වගන්තිය හෝ 7 (1) වන වගන්තිය යටතේ යම් ලොරියක සන්තකය භාර ගැනීමෙන් හෝ භාර ගැනීමෙහි ලා යම් තැනැත්තකු වැළැක්වීමේ හෝ ඔහුට බාධා කිරීමේ හෝ විරුද්ධකම් පෑමේ අදහසින් ඕනෑකමින් ම එකී ලොරිය ක්‍රියා විරහිත කරන හෝ ක්‍රියා විරහිත කිරීමට තැත් කරන හෝ කෙළින් ම හෝ අන් ලෙසකින් එකී ලොරිය ක්‍රියා විරහිත කිරීමට සලස්වන ; හෝ

(ඈ) 2 (4) වන වගන්තිය හෝ 7 (2) වන වගන්තිය යටතේ දෙන ලද යම් ලිඛිත විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින

සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකරු වන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම සහ දඩය යන දඬුවම් දෙකට ම යටත් වන්නේ ය. තව ද ලොරියක ලියාපදිංචි කළ අයිතිකරු විසින් හෝ ඔහුගේ අනුයෝජිතයා විසින් හෝ සේවකයා විසින් ඒ වරද කරනු ලැබූ අවස්ථාවක ඒ වරද කරන ලද්දේ යම් ලොරියක් සම්බන්ධයෙන් ද ඒ ලොරිය ජනරජය වෙත සන්තක කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ හැකිය.

(3) පටහැනි ව කුමක් ඇත ද (1) වන උපවගන්තිය යටතේ සෑම වරදක් ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූල ව සහ එහි කාර්යයන් සඳහා සංජ්ඤෙය වරදක් වන්නේ ය.

(4) බලයලත් නිලධරයකු වෙත දක්වා ඇති හෝ දක්වනු ලැබීමට ඉඩ ඇති යම් බාධාවක් හෝ විරුද්ධකම් පෑමක් නිසා ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් යම් ලොරියක සන්තකය භාර ගැනීමට ඔහු අපොහොසත් වන හෝ තමා එසේ වූ අපොහොසත් විය හැකි යයි ඔහුට සිතෙන අවස්ථාවක, ඒ ලොරිය තබා ඇති ස්ථානය පිහිටි ප්‍රදේශයෙහි අධිකරණ බලය දරන මහෙස්ත්‍රාත් අධිකරණය වෙත, ඒ වෙනුවෙන් ඒ නිලධරයා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කළ විට ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් ඔහුට ඒ ලොරියේ සන්තකය භාරදෙන ලෙස පිස්කල්ට විධාන කෙරෙන ආඥාවක් ඒ අධිකරණයෙන් ලබා ගැනීමට ඒ නිලධරයාට හිමිකම් තිබෙන්නේ ය.

(5) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් (4) වන උපවගන්තිය යටතේ පිස්කල් වෙත ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් ඒ ආඥාව වහා ම ක්‍රියාත්මක කොට ඒ ආඥාව ක්‍රියාත්මක කරනු ලැබූ ආකාරය ඒ අධිකරණය වෙත ලියවිල්ලකින් වාර්තා කළ යුතුය.

(6) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, පිස්කල් විසින් හෝ ඔහුගේ මෙහෙයවීම යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින්, ඒ ආඥාව අදාළ වන ලොරිය තබා ඇති යම් ස්ථානයකට ඇතුළු වී ඒ ලොරිය තහනමට ගැනීමටත් ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් එහි සන්තකය බලයලත් නිලධරයාට භාර දීමටත් අවශ්‍ය විය හැකි බලයක් පාවිච්චි කළ හැකිය.

මේ පනත යටතේ බලකර ලබා ගන්නා ලද ලොරි සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි සඳහා හිමිකම් පෑම.

9. මේ පනතෙහි විධිවිධාන යටතේ යම් ලොරියක් බලකර ලබා ගන්නා ලද අවස්ථාවක, එසේ බලකර ලබා ගත් අවස්ථාවේ ඒ ලොරියෙහි ලියාපදිංචි කළ අයිතිකරු විසින්, එසේ එය බලකර ලබා ගන්නා ලද දින සිට දින තිහක් ඉකුත් වූ පසු මාසයක් ඇතුළත, ඒ ලොරිය සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි සඳහා ලිඛිත හිමිකම් පෑමක් ඉදිරිපත් කළ හැකි අතර ඒ හිමිකම් පෑමෙහි—

(අ) තමාගේ නම සහ ලිපිනය ;
(ආ) තමාගේ අයිතියේ ස්වභාවය ;
(ඇ) හිමිකම් පෑම ඉදිරිපත් කරනු ලබන්නේ කිනම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද යන වග ; සහ
(ඈ) තමා විසින් ඉල්ලා සිටිනු ලබන මුදල

සඳහන් කළ යුතුය.

මේ පනත යටතේ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ ලොරි සම්බන්ධයෙන් ගෙවිය යුතු වන වන්දියට හිමිකම් පෑමට අයිතිය ඇති තැනැත්තන් වෙත කරනු ලබන දැන්වීම.

**10.** ලොරියක් ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි සහ තමා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් ආකාරයකින් පළ කරනු ලබන දැන්වීමක් මගින්, නියම බලධරයා විසින්, ඒ ලොරියේ සෑම ලියාපදිංචි කළ අයිතිකරුවකුට ම, ඒ දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් දින සිට එක් මාසයක කාලසීමාවක් ඇතුළත ඒ ලොරිය සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවිය යුතු වන්දි මුදල සඳහා හිමිකම් පෑමක් ඉදිරිපත් කරන ලෙස ද තම හිමිකම් පෑමෙහි—

(අ) තමාගේ නම සහ ලිපිනය ;

(ආ) තමාගේ ඉල්ලීම පිළිබඳ විස්තර ; සහ

(ඇ) තමා විසින් ඉල්ලා සිටිනු ලබන වන්දි මුදලේ ප්‍රමාණය

සඳහන් කරන ලෙස ද විධාන කළ යුතුය.

හිමිකම් පෑම සම්බන්ධයෙන් වන්දි නිශ්චය කිරීම.

**11.** (1) මේ පනත යටතේ ගෙවිය යුතු වන්දි මුදල සඳහා 9 වන වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ කරන ලද යම් හිමිකම් පෑමක් ලැබුණු විට, ඒ හිමිකම් පෑම සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල පිළිබඳ නිශ්චය කිරීමක් නියම බලධරයා විසින් හැකි පහසු ඉක්මණින් කළ යුතුය. තව ද තමා විසින් කරන ලද ඒ නිශ්චය කිරීම පිළිබඳ ලිඛිත දැන්වීමක් ඔහු විසින් දිය යුතුය.

(2) ගෙවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ වූ නිශ්චය කිරීම—

(අ) මහජන කාර්යයක් සඳහා තාවකාලික පාවිච්චියට බලකර ලබා ගන්නා ලද යම් ලොරියක් සම්බන්ධයෙන් වූ විට ඒ ලොරිය වෙනුවෙන් ඒම දිස්ත්‍රික්කය ඇතුළත ආණ්ඩුව විසින් ගෙවිය යුතු ව තිබූ කුලී ප්‍රමාණයත් ඒ ලොරිය බලකර ලබාගෙන ඇත්තේ කවර කාලසීමාවක් සඳහා ද යන වගත් සලකා බැලීමෙන් ; සහ

(ආ) ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ යම් ලොරියක් සම්බන්ධයෙන් වූ විට, ලොරියේ ලියාපදිංචි කළ අයිතිකරු විසින් ගෙවන ලද ලොරියේ ආනයන වටිනාකමත් එය පාවිච්චි කරන ලද කාලසීමාව සඳහා වටිනාකමෙහි ක්ෂයවීමත් ලොරියෙහි සන්තකය භාරගන්නා අවස්ථාවෙහි එහි තත්ත්වයත් සලකා බැලීමෙන්

කළ යුතුය.

(3) නියම බලධරයාගේ නිශ්චය කිරීම, 12 වන වගන්තිය යටතේ වූ යම් අභියාචනයකට යටත් ව අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර එය කිසි ම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

12. (1) මේ පනත යටතේ වන්දි සඳහා ඉදිරිපත් කරන ලද හිමිකම් පෑමක් විෂයයෙහි නියම බලධරයා විසින් කරන ලද නිශ්චයක් සම්බන්ධයෙන් ඔහුගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, 11 වන වගන්තිය යටතේ වූ නිශ්චය කිරීම පිළිබඳ දැන්වීම ලැබී දින දහහතරක් ඇතුළත දී, තත් කාර්යය සඳහා පිහිටුවන ලද විනිශ්චය අධිකාරය වෙත ඒ නිශ්චය කිරීමට විරුද්ධ ව අභියාචනා කළ හැකිය. — 11 වන වගන්තිය යටතේ වන්දි නිශ්චය කිරීමකට විරුද්ධ ව අභියාචනා කිරීම.

(2) එම විනිශ්චය අධිකාරය, අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ නිර්දේශය අනු ව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු අතර, ඔවුනතුරෙන් එක් කෙනකු යටත් පිරිසෙයින් පස් වර්ෂයක වෘත්තීය පළපුරුද්ද ඇති නීතිඥවරයකු හෝ අධිනීතිඥවරයකු විය යුතුය.

(3) විනිශ්චය අධිකාරයේ ගණපූරණය සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතුය.

(4) විනිශ්චය අධිකාරයේ සභාපති එම අධිකාරයේ එක් එක් රැස්වීමේ දී එහි සාමාජිකයන් විසින් පත්කර ගනු ලැබිය යුතුය.

(5) විනිශ්චය අධිකාරයේ සාමාජිකයන්ට නියම කරනු ලබන ප්‍රමාණ අනු ව පාරිශ්‍රමික ගෙවිය යුතුය.

(6) ගෙවිය යුතු වන්දිය වශයෙන් නියම බලධරයා විසින් 11 වන වගන්තිය යටතේ නිශ්චය කරන ලද මුදල් ප්‍රමාණය ස්ථිර කිරීම හෝ වැඩි කිරීම හෝ විනිශ්චය අධිකාරය විසින් කළ හැකිය.

(7) යම් අභියාචනයක් සම්බන්ධයෙන් විනිශ්චය අධිකාරයේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන අතර කිසිදු අධිකරණයක දී එය ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

13. (1) මේ පනත යටතේ ගෙවිය යුතු වන්දිය එම ලොරිය බලකර ලබාගත් හෝ අත්කර ගත් අවස්ථාවෙහි ඒ ලොරියේ ලියාපදිංචි කළ අයිතිකරු ව සිටි තැනැත්තා ට ගෙවිය යුතුය. — වන්දි ගෙවීම.

(2) ලොරිය බලකර ලබා ගන්නා ලද හෝ අත්කර ගන්නා ලද දිනයෙහි වලංගු ව පවතින ගිවිසුම්ක බලය ප්‍රකාර එම ලොරිය සන්තකයෙහි තබා ගැනීමට හා පාවිච්චි කිරීමට එම ලොරියේ ලියාපදිංචි කළ අයිතිකරු නොවන අන් තැනැත්තකු හිමිකම් ලබා සිටි අවස්ථාවක, වන්දිය ගෙවනු ලබන ලියාපදිංචි කළ අයිතිකරු විසින්, ඒ අන් තැනැත්තා වෙනුවෙන් භාරකරුවකු වශයෙන් එය භාරගනු ලබන ලෙස සැලකිය යුතුය.

14. මේ පනතෙහි යම් විධිවිධානයක් යටතේ යම් තැනැත්තකුට දිය යුතු යම් දැන්වීමක් හෝ විධානයක් ලියාපදිංචි කරන ලද ලිපිය කින් ඔහු වෙත තැපැල් මාර්ගයෙන් යවනු ලැබුව හොත් ඒ දැන්වීම හෝ විධානය ඔහුට දී ඇති ලෙස සලකනු ලැබිය යුතුය. — පුද්ගලයකු වෙත දැන්වීම හෝ විධානය භාරදිය හැකි ආකාරය.

15. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ යම් වරදක් කරනු ලැබූ අවස්ථාවක— — පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

(අ) ඒ මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම එම වරද කරන්නකු ලෙස සලකනු ලැබේ; තවද

(ආ) ඒ මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයෙහි සෑම කොටස්කරුවකු ම එම වරද කරන්නකු ලෙස සලකනු ලැබේ:

එසේ වුව ද තමාගේ දැනුම නොමැති ව ඒ වරද කර ඇති බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා තිසි සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඒ අධ්‍යක්ෂවරයා හෝ කොටස්කරු විසින් ඔප්පු කරනු ලැබුව හොත් ඔහු මේ පනත යටතේ වරදක් කරන්නකු ලෙස සලකනු නොලැබේ.

නියෝග.

**16.** (1) පහත සඳහන් කරුණු සියල්ල ම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය:—

(අ) විනිශ්චය අධිකාරයේ සාමාජිකයන්ගේ ධුර කාලය;

(ආ) විනිශ්චය අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකි ක්‍රමය සහ ආකාරය;

(ඇ) අභියාචනා පිළිගැනීමේ දී, විභාග කිරීමේ දී සහ තීරණය කිරීමේ දී විනිශ්චය අධිකාරය විසින් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය;

(ඈ) නියම කළ යුතු යයි මේ පනතෙහි ප්‍රකාශ කර ඇති හෝ නියම කර ඇති සියලු කරුණු; සහ

(ඉ) ඉහත සඳහන් කරුණුවලට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් සියලු කරුණු.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ ඒ නියෝගයෙහි නිශ්චිත ව සඳහන් කරනු ලබන පසු ව එළඹෙන දිනයක ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලබන යම් නියෝගයක් අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර ඒ යටතේ ඊට පෙර කරන ලද යම් දෙයකට ඉන් හානියක් සිදු නොවන්නේ ය. නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

අර්ථ නිරූපනය.

**17.** මේ පනතෙහි—

"උචිත බලධරයා" යන්නෙන් අමාත්‍යාංශයක ලේකම් හෝ රාජ්‍ය සංස්ථාවක සභාපති අදහස් වේ;

"නියම බලධරයා" යන්නෙන් මෝටර් වාහන පනතෙහි අර්ථානුකූල වූ මෝටර් වාහන කොමසාරිස් හෝ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි වෙන යම් තැනැත්තෙක් අදහස් වේ;

"බලකර ලබා ගැනීම" යන්න එහි ව්‍යාකරණානුකූල වෙනස්වීම් සහ සජාතීය යෙදුම් ද සමග ගත්විට, එය ලොරියක් සම්-

බන්ධයෙන් යෙදෙන්නා වූ කල්හි, ඒ ලොරියෙහි සන්තකය ලබා ගැනීම හෝ නියම බලධරයාට කැමති ලෙස පාවිච්චි කිරීමට ඒ ලොරිය දෙන ලෙස නියම කිරීම ඉන් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් ආධාරයක් හෝ ණයක් වශයෙන් හෝ අන් ආකාරයකින් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සපයන ලද ප්‍රාග්ධනයෙන්, සමාගම් ආඥා පනත නොවන වෙන යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් අදහස් වේ;

"මහජන කාර්යය" යන්නෙන්,—

(අ) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් බඩු හෝ කෘෂි ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීමට හා බෙදා හැරීමට, හෝ

(ආ) කැණීමේ හෝ ඉදිකිරීමේ වැඩකට අදාලව රාජ්‍ය සංස්ථාවක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් හෝ සමුපකාර සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන හෝ භාරගනු ලබන සේවයක් අදහස් වේ;

"ලියාපදිංචි කළ අයිතිකරු" යන්නෙන්, එය ලොරියක් සම්බන්ධයෙන් යෙදෙන්නා වූ විට, ඒ ලොරියෙහි අයිතිකරු වශයෙන් මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ තත් කාලයෙහි ලියාපදිංචි කරනු ලැබ සිටින තැනැත්තා අදහස් වේ; තව ද

"ලොරිය" යන්නෙන් සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් බඩු ගෙන යාම සඳහා තනන ලද්දා වූ හෝ යොදා ගනු ලද්දා වූ ද මෝටර් වාහනයක් අදහස් වන අතර, එසේ සාදන ලද හෝ යොදා ගන්නා ලද ට්‍රේලරයක් සහ ට්‍රැක්ටරයක් ද කැණීමේ හෝ ඉදිකිරීමේ කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලබන යම් යන්ත්‍රෝපකරණයක් ද එයට ඇතුළත් වේ.

3—ඒ 02774 (73/12)